**වැව්ලි භාර අරමුදල - 2015**
**------------------------------**

වැව්ලි භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම් සහ භාරකාර මුදලේ භාරකරුවන් අතර 2004 ඔක්තෝබර් 01 දින එළඹි අංක 1142 දරන භාර ඔප්පුවේ 13.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම භාරකාර මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැවිලි භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයෙන් පසුව භාරකාර අරමුදල ක්‍රියාත්මක නොවූවද පිළිවෙලින් රු.3,389,862 ක් භාරකාර ගාස්තු ලෙස ගෙවා ඇති අතර රු.107,198 ක් කළමනාකරණ ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) ලාභ අලාභ ගිණුමේ දක්වා ඇති රු.59,938,149 ක ආයෝජන මත පොලී ආදායම ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සඳහා සහතික නොමැතිකම හේතුවෙන් සත්‍යාක්ෂණය කර ගැනීමට නොහැකිවිය.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.58,400,083 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.82,217,018 වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,816,935 ක පිරිහීමක් දැක්වුණි. ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් හා ණයකර මත පොලී ආදායම පිළිවෙලින් රු.19,768,498 ක් හා රු.5,337,730 කින් අඩු වීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය තුළ භාරකාර අරමුදලේ මෙහෙයුම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 998,291,631 |
| 2015 සැප්තැම්බර් 30 දක්වා කාල සීමාව සඳහා ලාභය | 38,805,703 |
| 2015 සැප්තැම්බර් 30 – 2015 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව සඳහා ලාභය | 2,074,055 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු | 181,794,533 |
| 2015 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද ශේෂය | 1,220,965,922 |

**4. මෙහෙයුම් ප්‍රතිඵලය**

**-----------------------**

**4.1 කාර්යසාධනය**

**----------------**

භාරකාර අරමුදලේ ප්‍රධාන අරමුණ වනුයේ බාහිර සහායකින් තොරව දිගුකාලීන තිරසාරත්වය සඳහා වඩා යහපත් මූල්‍ය තත්ත්වයක් ඇති කිරීමට පහසුකම් සැලසීම සඳහා වැවිලි සමාගම්වල ආයෝජන කිරීම හා ලාභදායීත්වය වර්ධනය කිරීම වුවත්, ප්‍රතිලාභීන් 23 දෙනෙකු අතරින් ප්‍රතිලාභීන් 05 දෙනෙකුට රු. මිලියන 470 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**--------------------------------------**

වැවිලිභාර අරමුදලේ සාමාජිකයන් දෙදෙනෙකු වෙනුවට මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂවරයා මූල්‍ය ප්‍රකාශන අත්සන් කර තිබුණි.